## ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ශ්‍රී ලංකාවේ විස්තීර්ණ ණය පහසුකමෙහි හය වැනි සමාලෝචනය පිළිබඳ නිලධාරී මට්ටමේ එකඟතාවකට එළඹෙයි

## 2019 සැප්තැම්බර් 24 දින

මෙම ප්‍රකාශනයේ අඩංගු අදහස් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) නිලධාරීන්ගේ මතය වන අතර, එමගින් ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ මතය අත්‍යවශ්‍යයෙන් පිළිබිඹු නොවේ. මේ දක්වා නිරීක්ෂණය කොට ඇති කරුණු පදනම් කරගෙන, කළමනාකාරිත්වයේ අනුමැතියට යටත්ව, ජා.මූ. අරමුදලේ නිලධාරීන් විසින් වාර්තාවක් පිළියෙළ කරනු ලබන අතර, එය ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ සාකච්ඡා කිරීමටත්, තීරණ ගැනීම සඳහාත් ඉදිරිපත් කෙරේ.

- ආර්ථිකය අඛණ්ඩව යථා තත්ත්වයට පත්වීම සහ සමාජ අරමුණු සඳහා සහාය වීමට අවකාශය සලසමින්, රාජ්‍ය ණය තිරසාරභාවය පවත්වා ගැනීමට අවශ්‍ය රාජ්‍ය මූල්‍ය විනය සහ ආයතනික ප්‍රතිසංස්කරණ කෙරෙහි ශ්‍රී ලාංකික බලධාරීන්ගේ ඇති කැපවීම  අපි අගය කරමු.

- ජාත්‍යන්තරව පිළිගත් සම්මතයන්ට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ නීතිමය රාමුව, පාලනය, වගවීම සහ විනිවිදභාවය ශක්තිමත් කරමින් ඉදිරියේදී හඳුන්වා දීමට නියමිත නව මහ බැංකු පනත, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සපුරා ගැනීමේ පෙර දැක්ම තුළ වැදගත් සන්ධිස්ථානයක් බවට පත් වනු ඇත.

- වෙළඳ සහ ආයෝජන ලිහිල්කරණය, රාජ්‍ය අංශය සතු ව්‍යවසායන්හි ප්‍රතිසංස්කරණ සහ දූෂණ විරෝධී උත්සාහයන් වේගවත් කිරීම, ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය සහ මැදිකාලීන වර්ධනය ශක්තිමත් කිරීමට වැදගත් වනු ඇත.

සිව් අවුරුදු විස්තීර්ණ ණය පහසුකම් සැලසුම යටතේ ක්‍රියාත්මක කෙරෙන ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ හය වැනි සමාලෝචනය පැවැත්වීම සඳහා මැනුඑලා ගොරෙති (Manuela Goretti) මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුතු ජා.මූ. අරමුදලේ නිලධාරී කණ්ඩායමක් 2019 සැප්තැම්බර් 10-25 කාලය තුළ දී කොළඹට පැමිණි අතර, සිය සංචාරය අවසානයේ ගොරෙති මහත්මිය විසින් පහත ප්‍රකාශය සිදු කරන ලදී:

“විස්තීර්ණ ණය පහසුකම යටතේ ක්‍රියාත්මක කෙරෙන වැඩසටහනෙහි හය වැනි සමාලෝචනය පිළිබඳව ජා.මූ. අරමුදලේ නිලධාරී කණ්ඩායම සහ ශ්‍රී ලංකා බලධාරීන් අතර අවබෝධතාවන්ට එළඹිණි. මෙම සමාලෝචනය සඳහා සපුරාලිය යුතු සියලුම කාර්යයන් සහ ව්‍යුහාත්මක මිණුම් දඬු නිම කිරීමට අවශ්‍ය පියවර ඊළඟ සති කිහිපය තුළ දී බලධාරීන් විසින් ගනු ඇත.

“අප්‍රේල් මාසයේ දී සිදු වූ ඛේදනීය ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව රටේ ආරක්ෂක තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීමට සහ ඉන් ආර්ථිකයට ඇති වූ කම්පනයෙහි බලපෑම අවම කිරීමට බලධාරීන් විසින් ගනු ලැබූ උත්සාහයන් දූත පිරිසේ පැසසුමට ලක් වේ. 2019 වසර සඳහා වූ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.යේ) වර්ධනය සියයට 2.7 ක් ලෙස සංශෝධනය කර ඇති අතර සංචාරක පැමිණීම් සහ ඒ ආශ්‍රිත ආර්ථික කටයුතු ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීම සමඟ 2020 වසරේදී ද.දේ.නි.යේ වර්ධනය සියයට 3.5 ක් දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ. 2019-20 කාලපරිච්ඡේදය තුළ දී උද්ධමනය සියයට 4.5 ක් පමණ ස්ථායී මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෑතකාලීනව සංචාරක පැමිණීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඩු වුවද, 2018 වසර අවසානයේ සිදු වූ විනිමය අනුපාතිකයේ ගැලපීම ආධාරයෙන් ආනයන පහළ යාම සහ අපනයන ශක්තිමත් වීම හමුවේ 2019 වසරේදී ජංගම ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.6 ක් දක්වා පහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ.

“මන්දගාමී ගෝලීය පෙරදැක්ම සහ ශ්‍රී ලංකාවේ ඉහළ රාජ්‍ය ණය ප්‍රමාණය හමුවේ සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීමට විචක්ෂණශීලී ප්‍රතිපත්ති පවත්වාගෙන යාම සහ ආයතනික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම තීරණාත්මක වේ.

“2018 වසරේ දී වූ දේශපාලනික අස්ථාවරභාවය සහ පාස්කු ප්‍රහාරයන්හි ප්‍රතිඵල, රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. 2018 වසරේ සිට ඉදිරියට ගෙන එන ලද විදේශීය මූල්‍යනයන්ගෙන් යුතු ප්‍රාග්ධන ව්‍යාපෘති සහ හිඟ මුදල් පියවීම හේතුවෙන් වසරේ මුල් කාලය තුළදී වියදම් එක්රැස් වීම මෙන්ම ත්‍රස්තවාදී ප්‍රහාරයන්ගෙන් පසුව වක්‍ර ආදායම් තියුණු ලෙස පහළ යෑම හේතුවෙන් ජූනි අග රාජ්‍ය මූල්‍ය ඉලක්කය විශාල ප්‍රමාණයකින් මඟ හැරිණි. පස් වන සමාලෝචනයේ දී එකඟතාවයකට පැමිණි වැඩසටහන් ඉලක්ක තවදුරටත් ළඟා විය නොහැකි මට්ටමක පැවතුන ද, 2019 අයවැයෙහි ඉතිරිව ඇති ආදායම් සම්බන්ධ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සහ විචක්ෂණශීලී වියදම් කළමනාකරණය තුළින් 2019 වසරේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 0.2 ක ප්‍රාථමික රාජ්‍ය මූල්‍ය අතිරික්තයක් ළඟා කර ගැනීමට බලධාරීහු කැප වී සිටිති.

“වැඩසටහන යටතේ අත්කර ගත් ප්‍රතිලාභ ආරක්ෂා කර ගැනීමට, ඉහළ මට්ටමක පවතින රාජ්‍ය ණය පහළ දැමීමට සහ වඩාත් ඉලක්කගත සමාජ සහ ප්‍රාග්ධන වියදම් සඳහා ඉඩකඩ සලසා දීමට මැදිකාලීනව සහ 2020 වසරේදී ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඉදිරියට ගෙන යෑම සඳහා බලධාරීන් දක්වන කැපවීම දූත මණ්ඩලයේ අගය කිරීමට ලක් විය. බදු පදනම පුළුල් කිරීම සහ බදු අනුකූලතාව සහතික කිරීම තුළින් රාජ්‍ය ආදායම් වර්ධනය කිරීම සහ වියදම් කළමනාකරණයෙහි කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීමට අඛණ්ඩව පියවර ගත යුතු වේ. රාජ්‍ය ණය තිරසාර මට්ටමක පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූල වන පරිදි, ස්වාධීන රාජ්‍ය ණය කළමනාකරණ ආයතනයක් පිහිටුවීමට සහ රාජ්‍ය මූල්‍ය නීති නැවත සකස් කිරීමට බලධාරීන්ගේ මැදිකාලීන සැලසුම් දූත මණ්ඩලයේ ඇගයීමට ලක් විය. විදුලිබල අංශයෙහි පිරිවැය අකාර්යක්ෂමතා සහ සහනාධාර මනාව කළමනාකරණය කර ගනිමින් බලශක්ති අංශයෙහි ප්‍රතිසංස්කරණ ශක්තිමත් කිරීම මෙන්ම ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි මූල්‍යමය ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීම, රාජ්‍ය මූල්‍ය අවදානම් අවම කර ගැනීම සඳහා අවශ්‍ය වන වැදගත් පියවර වේ.

"ශ්‍රී ලංකා මහ බැංකුවේ විචක්ෂණශීලී සහ දත්ත මත පදනම් වූ මුදල් ප්‍රතිපත්ති ප්‍රවේශය සහ වැඩසටහනෙහි එකඟතාවන්ට අනුකූල වන පරිදි සංචිත මට්ටම් ශක්තිමත් කිරීම සඳහා වන එහි කැපවීම සඳහා දූත පිරිස සහාය දැක්වීය. දැඩි ගෝලීය මූල්‍ය තත්ත්වයන් හේතුවෙන් ඇති විය හැකි පීඩනය තීව්‍ර වුවහොත්, මහ බැංකුව, විනිමය අනුපාතිකය අඛණ්ඩව නම්‍යශීලීව පැවතීමට ඉඩ දිය යුතු අතර, විදේශ විනිමය වෙළඳපොළ වෙත සිදු කරන මැදිහත්වීම් අධික විචලනයන් අවම කිරීම සඳහා සීමා කළ යුතුය. නව මහ බැංකු පනත, ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූලව මහ බැංකුවේ අරමුණු, පාලනය, වගවීම සහ විනිවිදභාවය ශක්තිමත් කිරීම තුළින් නම්‍යශීලී උද්ධමන ඉලක්කරණයක් වෙත යොමු වීම සඳහා වන පෙර දැක්මෙහි වැදගත් සන්ධිස්ථානයක් වේ.

"ත්‍රස්ත ප්‍රහාරයන්ගෙන් අනතුරුව සංචාරක අංශයට පහසුකම් සැලසීම සඳහා සහ ණය තත්ත්වයන් පහසු කරවීම සඳහා, ණය ආපසු ගෙවීමේදී සහන සැලසීම මෙන්ම බැංකු පොලී අනුපාතික මත උපරිම සීමා පැනවීම යනාදී තාවකාලික පියවරයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කර ඇත. ණය ගුණාත්මකභාවය දුර්වල වීම සහ ලාභදායීත්වය පහළ යෑම හමුවේ මූල්‍ය පද්ධතියට සිදු විය හැකි අවහිරතා වැළැක්වීම සඳහා ණය තත්ත්වයන් ස්ථාවර වූ වහාම මෙම තාවකාලික පියවරයන් ඉවත් කළ යුතුය. බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනවල නියාමන සහ අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම සඳහා දරනු ලබන උත්සාහයන් දූත පිරිස විසින් අගයන ලදී. සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්ති රාමුව හා ආතති පරීක්ෂා (stress testing) හැකියාවන් වැඩිදියුණු කිරීම සහ අවදානම් රාමුව ඉහළ නැංවීම සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සැලසුම් මූල්‍ය පද්ධති ස්ථායීතාවය සඳහා දායකත්වය සපයනු ඇත. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම ශක්තිමත් කිරීම සහ ත්‍රස්තවාදී ක්‍රියා මූල්‍යනය කිරීමට එරෙහිව ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් බලධාරීන් ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

"රාජ්‍ය ආදායම කෙරෙහි ඇති විය හැකි බලපෑමට පිළියම් යොදන අතරතුර වෙළඳ සහ ආයෝජන යාන්ත්‍රණයන් ක්‍රමයෙන් ලිහිල් කිරීම තුළින් තරඟකාරිත්වය සහ මැදිකාලීන වර්ධනය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලාංකික බලධාරීන් විසින් අඛණ්ඩව සැලසුම් ක්‍රියාත්මක කිරීම දූත පිරිසේ පැසසුමට ලක් විය. විශේෂයෙන්ම රාජ්‍ය

අංශයේ ආයතන පාලනය සහ විනිවිදභාවය ඉහළ නැංවීම සහ දූෂණය අවම කිරීම මෙන්ම කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන උත්සාහයන් ඉහළ නැංවීම සහ සමාජ සුභසාධන සංක්‍රාම වඩාත් අවශ්‍ය වන පුද්ගලයින් වෙතම ලබා දීම කෙරෙහි ඉලක්ක කිරීම ආදිය සඳහා වන මනා කැපවීම තුළින් මෙම සැලසුම් සඳහා දායකත්වයක් සැපයිය යුතු වේ.

“ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත පිරිස මෙම සංචාරයේදී අග්‍රාමාත්‍ය වික්‍රමසිංහ, මුදල් අමාත්‍ය සමරවීර, මුදල් රාජ්‍ය අමාත්‍ය වික්‍රමරත්න, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති කුමාරස්වාමි, භාණ්ඩාගාර ලේකම් සමරතුංග, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වීරසිංහ යන මහත්වරුන්, වෙනත් රාජ්‍ය නිලධාරීන් සහ පාර්ලිමේන්තු විපක්ෂයේ, ව්‍යාපාරික ප්‍රජාවේ, සිවිල් සමාජයේ සහ ජාත්‍යන්තර ආයතනයන්හි නියෝජිතයන් ද හමු විය.”